# <u>මාධ්‍ය නිවේදනය</u>

2002.06.12 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති ජාතික බස්ගාස්තු ප්‍රතිපත්තිය අනුව 2002 ජූලි මස සිට බස්ගාස්තු සංශෝධනය ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් සිදුකරනු ලැබේ. එම බස්ගාස්තු ප්‍රතිපත්තිය අනුව වාර්ෂික බස්ගාස්තු ප්‍රතිශෝධනය සෑම වර්ෂයකම ජූලි මස 01 දින ප්‍රකාශයට පත්කළ යුතු අතර එසේම වර්ෂයේ ප්‍රථම මාස 09 තුල ඩීසල් මිළේ සීඝ්‍ර වැඩිවීමක් සිදු වුවහොත් සහ එම වැඩිවීම සමස්ථ කිලෝමීටර් එකක ධාවන පිරිවැය 4% කට අධික ප්‍රමාණයකින් වැඩිවීමට දායක වුවහොත් ඩීසල් මිළ වැඩිවී එක් මසක් තුල අතුරු ගාස්තු වැඩිවීමක් සිදු කළ යුතුය.

වර්තමානයේ ක්‍රියාත්මක වන බස්ගාස්තුව (2023.09.03 දින ප්‍රකාශයට පත් කරන ලද ) ගණනය කිරීමේදී 2023.09.01 දින ලංකා සුදු ඩීසල් ලීටර් එකක මිල වන රු.341/- මිල ගලපා ඇත. එහෙයින් 2024.02.01 දින සිට (2024.01.31 දින මධ්‍යම රාත්‍රියේ සිට) ලංකා සුදු ඩීසල් ලීටර් එකක මිල රු.363/- දක්වා වැඩි වීම, ජාතික බස්ගාස්තු ප්‍රතිපත්තිය සඳහන් මිල සූත්‍රයට ගැලපූ විට සමස්ථ කිලෝමීටර් එකක ධාවන පිරිවැය සියයට දෙකයි දශම හයයි එකකින් (2.61%) වැඩිවීමට දායක වී ඇති බැවින් උක්ත ජාතික බස්ගාස්තු ප්‍රතිපත්තිය අනුව බස් ගාස්තු වැඩිවීමක් සිදු නොවන බව සියළුම මහජනතාව වෙත කාරුණිකව දන්වා සිටිමි.

**සභාපති**<br>
**ජාතික ගමනාගමන කොමිෂන් සභාව**